# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/40/2022 (NPC)

ඩබ්.ජේ.එම්.ඩී බණ්ඩාර අරඹේපොල
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.04.30**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක මාලා බස්නායක මහත්මිය.

## -නියෝගය-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද වාචික සහ ඔවුනොවුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශන වලට අවධානය යොමු කරන ලදි.

අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2022.09.20 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ඉදිරිපත් කර ඇති විනය දඬුවම අහෝසි කර දෙන ලෙසයි.

ඉහත කී දඬුවම අභියාචක වෙත නිකුත් කර ඇත්තේ, විශේෂ කාර්ය බලකා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ 2019.08.31 දිනැති ලිපියේ සඳහන් විනය නියෝගය හේතුවෙනි. එකී විනය නියෝගය නිකුත් කර ඇත්තේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාවට ඔහු වැරදිකරු කර තිබීම නිසාවෙනි. ඔහු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනාව 2018.12.26 දිනැතිව විශේෂ කාර්ය බලකා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති ලිපියේ සඳහන් වේ. එම චෝදනාව පහත දැක්වේ;

**" I. අපකීර්තිදායක හැසිරීම,**

**ඔබ රජයේ සේවයේ, ශ්‍රී ලංකා පොලීසියේ, විශේෂ කාර්ය බලකායේ උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් විශේෂ කාර්ය බලකාය, අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාශයේ කොල්ලුපිටිය කඳවුරට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී 2018.07.13 දින රාජකාරී කටයුත්තක් සඳහා අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාශයට අයත් අංක WP PA 2513 දරණ කැබ් රථයෙන් ගමන් කරමින් සිටියදී කොළඹ – කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ පොතුහැර නගරයේ දී කැබ් රථයේ අංක WP BBK 7264 දරණ යතුරු පැදියේ ගැටීම හේතුවෙන් සිදුවූ අනතුර, උසස් නිලධාරීන්ට වාර්තා නොකිරීම සහ පොතුහැර පොලිස් ස්ථානය විසින් අත් අඩංගුවට ගෙන පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී ලංකා පොලීසියට සහ විශේෂ බලකායට අපකීර්තියක් සිදුවන අයුරින් ක්‍රියා කිරීමෙන් පොලිස් නියෝග ඒ-7 බී පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 01 වන වගන්තිය යටතේ දැක්වෙන අපකීර්තිදායක හැසිරීම එනම්, "*එනම් අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානිකර වන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැලලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම, යන වරද සිදුකළ බවද,*"** යනුවෙනි.

ඉහත කී චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, අභියාචක රාජකාරී කටයුත්තක් තුළදී, ඔහු ගමන් කරමින් සිටි වාහනයේ යතුරු පැදියක් ගැටීම හේතුවෙන්, අභියාචක විසින් එම කරුණ උසස් පොලිස් නිලධාරීන්ට වාර්තා නොකිරීම යන පදනම යටතේ ය. ඒ හැරෙන්නට, ඔහුව අදාළ පොලිස් ස්ථානය විසින් අත් අඩංගුවට ගෙන, පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කිරීම යන කරුණද එම චෝදනාව තුළට ඇතුළත් කර ඇත. එසේ අභියාචක විසින් රිය ගැටුම වාර්තා නොකිරීම යන කරුණට වරදකරු කිරීම දෝෂ සහගත වන්නේ නම්, අනිකුත් කරුණ සම්බන්ධයෙන් ඔහු වරදකරු කිරීම නිවැරදි වන්නේ නැත.

කෙසේ වෙතත් මෙම සිද්ධියට අදාළව වන කරුණු සළකා බලමු. ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව, අභියාචක නිල රාජකාරියක් සඳහා අංක WP PA 2513 දරණ කැබ් රථයෙන් ගමන් කර, එකී රථය යම්කිසි ස්ථානයක නවතා තිබී ඇත. එසේ නවතා තිබියදී සිදුවූ අනතුරක් හේතුවෙන් මෙම චෝදනාව ඉදිරිපත් කර ඇත. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් පවසා සිටින්නේ, අභියාචක රථයේ පිටුපස ආසනයේ සිට පසුපස දොර ඇරීම නිසා එක් වරම යතුරු පැදියක ඝට්ඨනය වූ බවයි. ඒ බව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2025.10.14 දිනැති වාර්තාවේ සඳහන් වේ. අභියාචක වෙනුවෙන් පවසා සිටින්නේ, ඔහු ගමන් ගත් නිල රථය භාවිතා කරමින් රාජකාරියේ යෙදුන ප්‍රධාන නිලධාරියා අභියාචකට වඩා උසස් මට්ටමේ නිලධාරියෙකු බවත්, ඔහු මෙම කැබ් රථයේ ඉදිරිපස අසුනේ සිටි බවත්ය. එම අය පොලිස් පරීක්ෂක සී.බී.ලොකුකුමාර බවට සඳහන් වේ. එම කරුණ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ ද සඳහන් වේ. ඒ හැරෙන්නට මෙම රථය පදවා ගෙන ගොස් ඇති පොලිස් රියදුරුද එම අවස්ථාවේ වාහනයේ සිට ඇත. එවැනි තත්ත්වයක් යටතේ අනතුර වාර්තා කිරීමේ ප්‍රධාන වගකීම ඉහත කී උසස් පොලිස් නිලධාරියාට සහ පොලිස් රියදුරුට පැවරෙනවා ඇත. ඇත්ත වශයෙන්ම එම තත්ත්වය යටතේ මෙම අභියාචකට එවැනි වගකීමක් පැවරෙන්නේ නැත.

ඉහත කී කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවේ සඳහන් ප්‍රධාන චෝදනාව ඔප්පු කිරීමට ඔහුට විරුද්ධව සාක්ෂි නොමැති බවයි. ඒ අනුව ඒ ආකාරයෙන් එම චෝදනාවට අභියාචක වරදකරු කිරීම දෝෂ සහගත වේ.

කෙසේ වෙතත් ඉදිරිපත් වී ඇති කරුණු අනුව මෙම සිද්ධිය නිසා පොලීසියට සහ විශේෂ කාර්ය බලකායට අපකීර්තියක් සිදුවී ඇත්ද යන කරුණ සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. අභියාචක විසින් සිදුකළා යැයි කියන ලබන වාහනයේ පසුපස දොර විවෘත කිරීම සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති ධනුෂ්ක නුවන් හඳුන්නෙත්ති යන අයගේ සාක්ෂිය සළකා බලන ලදි. ඔහුගේ සාක්ෂියෙන් සනාථ වන්නේ, අභියාචක පොලිස් නිලධාරියෙකු ලෙස කටයුතු කර ඇති ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවයි.

ඉහත කරුණු සළකා බැලීමෙන් පසුව විනිශ්චය අධිකාරයේ මතය වන්නේ, අභියාචක වෙත පනවා ඇති දඩුවම බරපතල දඩුවමක් වන බවයි. එම කරුණු සළකා බලා අභියාචක වෙත පනවා ඇති දඩුවම ලිහිල් කිරීමට විනිශ්චය අධිකාරය තීරණය කරමු.

මෙම තත්ත්වය යටතේ අභියාචක වෙත 2019.08.31 දිනැතිව නිකුත් කර ඇති, අභියාචකගේ වැටුප් වර්ධක එකක් විලම්භනය කරමින් පනවා ඇති විනය නියෝගය ඉවත් කරමු. ඒ වෙනුවට අභියාචක වෙත "***අවවාද කිරීම***" යන දඬුවම පැනවීමට තීරණය කරමු.

විනිශ්චය අධිකාරය විසින් පනවා ඇති දඩුවම, අභියාචක වෙත ලැබිය යුතුව තිබුණා යැයි කියනු ලබන උසස්වීම් යනාදියට බලපෑමක් නොවිය යුතුය.

ඉහත කරුණු සළකා බලා, ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව අභියාචනයට ඉඩදෙමු.

අභියාචනයට අවසර ලබා දී ඇත.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-